295 වන කාණ්ඩය - 13 වන කලාපය
தொகுதி 295 - இல. 13
Volume 295 - No. 13

2022 සැප්තැම්බර් 09වන සිකුරාදා
2022 செப்ரெம்பர் 09, வெள்ளிக்கிழமை
Friday, 09th September, 2022

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**

බනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත:**

පළමුවන වර කියවන ලදී

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**

பெற்றோலிய உற்பத்திப் பொருட்கள் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர்கள் நியமனம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்:**

முதன்முறை மதிப்பிடப்பட்டது.

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:

Petroleum Products (Special Provisions) (Amendment) Bill: Petition to the Supreme Court
Ministerial Consultative Committee on Fisheries: Nomination of Members

AUDITOR-GENERAL'S REPORT

POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL:

Read the First time

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2022 සැප්තැම්බර් 09වන සිකුරාදා***
*2022 செப்ரெம்பர் 09, வெள்ளிக்கிழமை*
*Friday, 09th September, 2022*

---

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. MAHINDA YAPA ABEYWARDANA] in the Chair.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
සභාවේ අවසරය ඇතිව, ගරු අග්‍රාමාත්‍යතුමා.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - பிரதம அமைச்சரும் பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரும்)
(The Hon. Dinesh Gunawardena - Prime Minister and Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government)
ගරු කථානායකතුමනි, දෙවන එළිසබෙත් රැජිනගේ වියෝව පිළිබඳව මේ අවස්ථාවේදී අපගේ ශෝකය ප්‍රකාශ කරනවා. මහා බ්‍රිතාන්‍යයේ මහ රැජින හැටියටත්, පොදු රාජ්‍ය මණ්ඩලයේ නායිකාව හැටියටත් එතුමියගේ අභාවය වෙනුවෙන් රාජකීය පවුලටත්, මහා බ්‍රිතාන්‍යයේ ජනතාවටත් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ශෝකය ප්‍රකාශ කිරීම සඳහා විනාඩි දෙකක නිශ්ශබ්දතාවක් පවත්වන්න මා මෙම ගරු සභාවේ අවසර පතනවා.

Sir, on the passing away of Her Majesty Queen Elizabeth II, Head of Great Britain and the Commonwealth, and in memory of Her Majesty, I propose that we observe a two-minute silence. A Vote of Condolence will be moved later.

***[ඊට අනුකූලව විනාඩි දෙකක නිශ්ශබ්දතාවක් පවත්වන ලදී.]***
*[அதன்படி, இரண்டு நிமிட மௌனம் அனுஷ்டிக்கப்பட்டது.]*
*[Whereupon a two-minute silence was observed.]*

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු කථානායකතුමනි, එතුමියගේ අභාවය පිළිබඳව ශෝකය පළ කිරීමේ යෝජනාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා ආණ්ඩු පක්ෂයේත්, විපක්ෂයේත් එකමුතුවෙන් විශේෂ දිනයක් යොදා ගැනීමට කටයුතු කරන ලෙස මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)
ගරු කථානායකතුමනි, 1952 දී සිය පියාගේ අභාවයෙන් පසුව දෙවැනි එළිසබෙත් රැජින මහා බ්‍රිතාන්‍යයේ මහ රැජින හැටියට පත් වුණා. මුළු ලෝකයේම හදවත දිනාගත් නායිකාවක් හැටියට අපි කවුරුත් එතුමියව ආදර්ශයක් හැටියට පිළිගැනීමක් තිබෙනවා. එතුමියගේ අභාවය පිළිබඳව මේ අවස්ථාවේදී විපක්ෂයේ සංවේගය මම ප්‍රකාශ කර සිටිනවා.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සමක්
பெற்றோலிய உற்பத்திப் பொருட்கள் (விசேட ஏற்பாடுகள்) (திருத்தம்) சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனு
PETROLEUM PRODUCTS (SPECIAL PROVISIONS) (AMENDMENT) BILL: PETITION TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
2022 සැප්තැම්බර් 07 දින මාගේ නිවේදනයෙහි සඳහන් පෙත්සම්වලට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද තවත් පෙත්සමක පිටපතක්, මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## II

### ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
கடற்றொழில் அலுவல்கள் பற்றிய அமைச்சுசார் ஆலோசனைக் குழு: உறுப்பினர்கள் நியமனம்
MINISTERIAL CONSULTATIVE COMMITTEE ON FISHERIES: NOMINATION OF MEMBERS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 112හි විධිවිධාන සහ 2022 අගෝස්තු 10 පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව, ධීවර කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සේවය කිරීම සඳහා, මතු සඳහන් මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි:-

ගරු විජිත හේරත් මහතා
ගරු දිලිප් වෙදආරච්චි මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු චින්තක අමල් මායාදුන්න මහතා
ගරු ඩී. වීරසිංහ මහතා

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව ජාතික විගණන කාර්යාලය වෙත ලැබී ඇති,

- දෙපාර්තමේන්තු පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 01 කොටස; සහ
- ප්‍රාදේශීය සභා පිළිබඳ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 14 වගන්තිය ප්‍රකාරව, විගණකාධිපති ත්‍රෛවාර්ෂික වාර්තාවේ එකළොස් වන කාණ්ඩයේ 06 (iii) කොටස මම ඉදිරිපත් කරමි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha - Minister of Education and the Leader of the House of Parliament)

ගරු කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් වාර්තා ඉදිරිපත් කරමි.

(i) 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාවේ වාර්ෂික වාර්තා;

(ii) 2020 වර්ෂය සඳහා මොරටුව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් වාර්තාව; සහ

(iii) 2020 වර්ෂය සඳහා නැගෙනහිර විශ්වවිද්‍යාලයේ ස්වාමි විපුලානන්ද සෞන්දර්ය අධ්‍යයන ආයතනයේ වාර්ෂික වාර්තාව.

මෙම වාර්තා අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා (වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு நிமல் சிறிபால த சில்வா - துறைமுகங்கள், கப்பற்றுறை மற்றும் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Nimal Siripala de Silva - Minister of Ports, Shipping and Aviation)

ගරු කථානායකතුමනි, මම 2018/2019 වර්ෂය සඳහා සීමාසහිත ලංකා නැව් සංස්ථාවේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව වරාය, නාවික හා ගුවන් සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවෙන් මම රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119 (4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

2021 වර්ෂය සඳහා පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්ය සාධන වාර්තාව.- [කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා වෙනුවෙන් මම 2017 වර්ෂය සඳහා ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කර්මාන්ත කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara - Minister of Labour and Foreign Employment)

ගරු කථානායකතුමනි, 2019 වර්ෂය සඳහා ජාතික වෘත්තීය සුරක්ෂිතතා හා සෞඛ්‍ය ආයතනයේ වාර්ෂික වාර්තාව මම ඉදිරිපත් කරමි.

මෙම වාර්තාව කම්කරු සහ විදේශ රැකියා කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, වාරිමාර්ග අමාත්‍ය සහ ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යතුමා වෙනුවෙන් මම 2018 සහ 2019 වර්ෂ සඳහා සෙන්ට්‍රල් ඉංජිනියරින් සර්විසස් ප්‍රයිවට් ලිමිටඩ් ආයතනයේ වාර්ෂික වාර්තා ඉදිරිපත් කරමි.

මෙම වාර්තා වාරිමාර්ග කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු රංජිත් සියඹලාපිටිය මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

ගරු ලසන්ත අලගියවන්න මහතා - *[සභා ගර්භය තුළ නැත.]*

**ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා**
(மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி)
(The Hon. Jagath Kumara Sumithraarachchi)

ගරු කථානායකතුමනි, ගාල්ල, අහුළුගහ, දොරපේ, මිල්ලගහවත්ත යන ලිපිනයෙහි පදිංචි උදේනි රත්නායක මහත්මියගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

***ඉදිරිපත් කරන ලද පෙත්සම මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***
*சமர்ப்பிக்கப்பட்ட மனு பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*
*Petition ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

2022 සැප්තැම්බර් 01 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේදී තීරණය කළ පරිදි අද දිනට නියමිත වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න වෙනත් දිනයකට යොමු කරනු ලැබේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, Committee on Parliamentary Businessහි ඉදිරියේදී පවත්වන රැස්වීමේදී අපේ රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් සමඟ ඇති කරගත් එකඟතාව ගැන විවාදයක් ඉල්ලන්න මා බලාපොරොත්තු වෙනවා. මම ඉල්ලා සිටිනවා, මේ එකඟත්වය හෝ ගිවිසුම හෝ ආණ්ඩුව බලාපොරොත්තු වන දේ හෝ එදිනට කලින් පාර්ලිමේන්තුවට දැනුම් දෙන්න කියලා. අපට එදිනට කලින් ඒ විස්තර ලබා දුන්නොත් එය විවාදයට උදවු වෙනවා.

මොකද, ඔබතුමාත් දන්නවා, මේ ප්‍රතිසංස්කරණ සාර්ථක කරගන්න රටේ ජනතාවගේ, විපක්ෂයේ සහයෝගය ඕනෑ බව. ඔබතුමා ඒක ගැන හොඳටම දන්නවා නේ. ඒ නිසා මේ කාර්යය හංගලා කරන්න බැහැ. අපි කැමැතියි, සහයෝගය ලබා දෙන්න. අපි දන්නවා රට වැටිලා තිබෙන තත්ත්වය. ඒ නිසා ඒ විවාදයට කලින්, රජය ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ඇති වුණු එකඟතාව පිළිබඳ යම්කිසි සටහනක් මේ ගරු සභාවේ අපේ මේස මත තිබෙන්න ඕනෑ. නැත්නම් අපි කොහොමද ඒ ගැන සාකච්ඡා කරන්නේ? We must have something in that regard on our table. පාර්ලිමේන්තුවේ සහයෝගය නැතිව, රටේ ජනතාවගේ සහයෝගය නැතිව මේ කටයුත්ත කරන්න බැහැ. ඔබතුමා දන්නවා ඒක. අපි උදවු කරන්න සූදානම්. අපි දන්නවා රටේ තිබෙන තත්ත්වය. But, we must know what exactly the Government wants to do. මම ඉල්ලන්නේ විවාද දිනයට කලින් අපට ඒ පිළිබඳ යම්කිසි සටහනක් ලබා දෙන්න කියලායි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉදිරිපත් කළ කාරණය ගැන මම අද උදෑසන ශ්‍රී ලංකා මහ බැංකුවේ Governor සමඟ සාකච්ඡා කළා. එතුමා කියනවා, ඒ වාර්තාව ඉදිරිපත් කරනවාට එතුමාගේ කිසිම විරෝධතාවක් නැහැ, ඒ ගැන කිසිම ප්‍රශ්නයක් නැහැ කියලා. එතුමා සූදානම් ඕනෑ වෙලාවක ඒ වාර්තාව දෙන්න. නමුත්, ඒ ගැන අවසාන තීරණය ගන්නේ මුදල් අමාත්‍යවරයායි. එයට හේතුව, එම යෝජනාවල බදු සම්බන්ධයෙන් වන සංවේදී යෝජනා කිහිපයක් තිබෙනවා, කලින් ප්‍රකාශ කළ නොහැකි. ඒ නිසා ඒ ගැන ගරු මුදල් අමාත්‍යතුමා එක්ක සාකච්ඡා කරලා තීරණයක් ගන්න කියලායි එතුමා මට දැන්වූවේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඔබතුමාගේ අදහසට මා ගරු කරනවා. නමුත්, පාර්ලිමේන්තුවට තමයි මුදල් බලය තිබෙන්නේ, ගරු කථානායකතුමනි. ඒ නිසා පාර්ලිමේන්තුවට හෙළි කරන්න බැරි කරුණු තිබෙනවාය කියා කාටවත් කියන්න බැහැ. මොකද, අපි මේවා හොරෙන් කරන්න ගියොත් ජනතාව විරුද්ධ වෙනවා. ඒක වැරදි දෙයක්; we must be open. ඒ නිසා, අපි කරන්නේ මොකක්ද කියන එක පිළිබඳ පැහැදිලි සටහනක් අපේ මේස මත තිබෙන්න ඕනෑ.

අනික, - මේ කාරණයත් මම ඔබතුමාට පාර්ලිමේන්තුවේදී කිව්වා - අපේ රටේ ඩොලර් සංචිතය ඇමෙරිකානු ඩොලර් මිලියන 20ට අඩු වෙනවා කියලා ඔබතුමා දැනගෙන සිටියාද? දැනගෙන සිටියේ නැහැ නේ. අපි කවුරුවත් ඒ ගැන දැනගෙන සිටියේ නැහැ. රටේ මුදල් තත්ත්වය ගැන අඩු ගානේ ඔබතුමාට හෝ දැනුම් දෙන්න ඕනෑ නේ, ගරු කථානායකතුමනි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මම ඒ සම්බන්ධයෙන් ගරු මුදල් ඇමතිතුමා එක්ක සාකච්ඡා කරන්නම්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු කථානායකතුමනි, මේ කාරණාව සම්බන්ධ පැහැදිලි කර ගැනීමක් සඳහා මම ඔබතුමාගෙන් පොඩි වෙලාවක් ඉල්ලා සිටිනවා.

ආණ්ඩු පක්ෂයේද, විපක්ෂයේද කියලා නැහැ, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු විධියට අපි සියලුදෙනාම අද මුහුණ දී තිබෙන්නේ දැඩි ප්‍රශ්නකාරී තත්ත්වයකට. මොකද, මේ රටේ ආර්ථිකය බිඳ දැමීමේ වරදට අපි සියලුදෙනා වගකිව යුතුයි කියන තැන ජනතාව ඉන්න වෙලාවක IMF එකේ එම වාර්තාව පිළිබඳව රටේ ජනතාව අවධානයෙන් ඉන්නේ. එම වාර්තාවේ සමහර සංවේදී කාරණා තිබෙන්න පුළුවන්, ගරු කථානායකතුමනි. නමුත්, ඒ වාර්තාව මොකක්ද, එහි රාමුව මොකක්ද කියන එක පිළිබඳව රටේ ජනතාව අවධානයෙන් ඉන්නවා. කැබිනට් මණ්ඩලයවත් නොදැනුවත්ව ඉතිහාසයේ අත්සන් කරපු ගිවිසුම් නිසා අපේ රටට හානිකර තත්ත්වයක් ඇතිවෙලා, අදත් ඒවා මතු වන වෙලාවක, මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමා එම ගිවිසුම ඉදිරිපත් කළ යුතුයි කියා මා විශ්වාස කරනවා. එහි ඉදිරිපත් කළ නොහැකි කාරණාව හැර, ඉතිරි කාරණා පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුයි. මොකද, මේකෙන් අනවශ්‍ය ප්‍රශ්නයක් ඇති විය හැකියි. විපක්ෂයේ අපට මේ කාරණාව අරගෙන ආණ්ඩුවට පහර ගහන්න වුවමනාවක් නැහැ. මේ මොහොතේ එවැනි වටපිටාවක් ඇත්තේත් නැහැ. එම නිසා මේ සම්බන්ධව විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන්න, ඔබතුමාගේ මැදිහත් වීමෙන් අවශ්‍ය පියවර ගන්න කියලා මා ඉල්ලීමක් කරනවා. එහෙම නැති වුණොත්, මේ පාර්ලිමේන්තුවේ දෙගොල්ලෝ එකතුවෙලා "ගේම්" ගහනවා කියන චෝදනාවට තවදුරටත් මේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ලක්වන එක බැහැර කරන්න බැරි වෙයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඔබතුමා කියපු කාරණය මම ගරු මුදල් ඇමතිතුමාගේ අවධානයට යොමු කරන්නම්, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, මේ ප්‍රශ්නය ඊයේත් මතු කළා. ඊයේ මම ඒකට සරල පිළිතුරක් දුන්නා.

ඇත්ත වශයෙන්ම IMF එකත් එක්ක ඇතිවන ගිවිසුම පිළිබඳ කරුණු හෙළිදරව් කිරීමේ කිසිම ගැටලුවක් නැහැ; ඒ කරුණු හෙළිදරව් කරන්න රජය හැටියට අපි පසුබට වෙන්නේත් නැහැ. හැබැයි, තවම එවැනි ගිවිසුමක් නැහැ. අවබෝධතාවක් විතරයි තිබෙන්නේ. අවසාන ගිවිසුමක් ඇති වෙන්නේ, IMF එකේ Board එකේ approval එක ලැබුණාට පසුවයි. ඒ කටයුතු සිදු වුණාම ඉදිරි දිනයකදී එය ලබා දෙන්න පුළුවන්.

ගරු කථානායකතුමනි, පසුගිය දවසක ගරු අගමැතිතුමාගේ ප්‍රධානත්වයෙන් අපි රැස් වෙලා ජාතික සභාව පිහිටුවීම පිළිබඳ එකඟත්වයකට ආවා. ඊළඟ සභා වාරය වන විට අපි ඒ කටයුතු අවසන් කරනවා. ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමනි, එතකොට ඔබතුමා කිව්ව විවාදයට පෙරාතුව, ජාතික සභාවට මෙහි ප්‍රතිපත්ති රාමුව ඉදිරිපත් කරන්න පුළුවන්. පක්ෂ නායකයන්ගෙන් සමන්විතව ජාතික සභාව පිහිටුවන්නෙත් රජයට මඟ පෙන්වීමක් කිරීම සඳහායි; ඒ පරමාර්ථය තමයි එතැන තිබෙන්නේ. ඒ නිසා ජාතික සභාව පිහිටෙව්වාට පසුව අපට ඒ කටයුත්තට අවතීර්ණ වෙන්න පුළුවන් කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ගරු කථානායකතුමනි, මා කියන්නේ මේකයි. Agreement එකක් අත්සන් කරලා නැති වෙන්න පුළුවන්. නමුත්, එකඟතාවකට පැමිණ තිබෙනවා නේ. ඒ එකඟතාව පිළිබඳව සටහන් කරලා අපට දෙන්න; ප්‍රතිපත්ති රාමුව අපට දෙන්න. එච්චරයි.

අනෙක, ජාතික සභාව පත් කිරීම සඳහා, නම් ලබා ගැනීම පමණයි තවම සිදු කර තිබෙන්නේ. ජාතික සභාව ක්‍රියාත්මක කරන්නේ කොහොමද කියලාවත්, ඒ structure එක මොකක්ද කියලාවත් දන්නේ නැහැ. ඇත්ත වශයෙන්ම අපි ජාතික සභාවට යෝජනා කරන්නයි හිටියේ, මෙච්චර ඇමතිවරු ගණනාවක් පත් කරන්න එපා කියලා. නමුත්, ජාතික සභාව පිහිටුවීමේ කටයුත්ත ප්‍රමාද වෙච්ච නිසා අපිට ඒක කරන්න බැරි වුණා. අපි අවංකවම සාකච්ඡා කරමින් සිටියේ, රට මේ වාගේ අගාධයකට වැටිලා තිබෙන අවස්ථාවක මෙච්චර ඇමතිවරු ප්‍රමාණයක් පත් කරන්න එපා කියන්නයි. රාජ්‍ය ඇමතිවරු 37දෙනකු මේ වන විට පත් කර තිබෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඒ පත් වූ රාජ්‍ය ඇමතිවරු කිසි කෙනකු විශේෂ වරප්‍රසාද ලබාගෙන නැහැ. මන්ත්‍රීවරයකුට ලැබෙන වරප්‍රසාද විතරයි එතුමන්ලාට තිබෙන්නේ.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

ඒ වුණාට ඔබතුමා දන්නවා නේ, ඒ වරප්‍රසාද ලබා ගන්න ක්‍රම සහ විධි තිබෙන බව. මේ තුළින් රටට පෙනෙන්නේ බොහොම අශෝභන චිත්‍රයක්. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

## පනත් කෙටුම්පත් පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட சட்டமூலங்கள்
## BILLS PRESENTED

### විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත් කෙටුම්පත
### நஞ்சுகள், அபின் மற்றும் அபாயகரமான அவுடதங்கள் (திருத்தம்) சட்டமூலம்
### POISONS, OPIUM AND DANGEROUS DRUGS (AMENDMENT) BILL

"(218 වන අධිකාරය වූ) විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි."

*පිළිගන්වන ලද්දේ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමා වෙනුවට ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා විසිනි.*

*2022 සැප්තැම්බර් 20වන අඟහරුවාදා දෙවන වර කියවිය යුතුයි ද, එය මුද්‍රණය කළ යුතුයි ද නියෝග කරන ලදී.*

*நீதி,சிறைச்சாலைகள் அலுவல்கள் மற்றும் அரசியலமைப்பு மறுசீரமைப்பு அமைச்சர் சார்பாக மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த அவர்களால் சமர்ப்பிக்கப்பட்டது.*

*2022 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை இரண்டாம் முறை மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. (Dr.) Susil Premajayantha on behalf of the Minister of Justice, Prison Affairs and Constitutional Reforms;*

*to be read a Second time upon Tuesday, 20th September, 2022 and to be printed.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2022 අගෝස්තු 09 සහ 12 දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්හි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 9.30 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා. 1.00 සිට අ.භා. 4.30 දක්වා ද විය යුතු ය. අ.භා. 4.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

මීළඟට, නවවැනි පාර්ලිමේන්තුවේ මන්ත්‍රී, ගරු අමරකීර්ති අතුකෝරළ මහතාගේ අභාවය පිළිබඳ කල්තබන ලද ශෝක ප්‍රකාශ යෝජනාව තවදුරටත් පැවැත්වීම.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු කථානායකතුමනි, ජාතික සභාව පිහිටුවීමට අදාළ නිවේදනය ගරු සභානායකතුමා මඟින් ඉදිරිපත් කර තිබෙනවා. මේ ගරු සභාව අද දින එය අනුමත කළොත්, ජාතික සභාව පිහිටුවා ඒ කටයුතු කරන්න පුළුවන්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

එය තවම එවලා නැහැ.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Then, the establishment of the National Council will get delayed. The announcement has been conveyed, Sir. ඊයේ දිනයේ භාර දීලා- *[බාධා කිරීමක්]* හරි, ඒක විසඳාගන්න. ගරු කථානායකතුමනි, නමුත් ඒ ප්‍රමාදයෙන් සිද්ධ වන්නේ ජාතික සභාව ස්ථාපිත කිරීම තවදුරටත් කල් යන එකයි. අපි ඒක draft කරලා එකඟතාවෙන් යුතුව ඉදිරිපත් කර තිබෙනවා. යම්කිසි නීත්‍යානුකූල අනුමැතියක් අවශ්‍යයි නේ, අපට රැස් වෙන්න. ඒක නේ කියන්නේ. මේ රටේ තිබෙන තත්ත්වයේ බරපතළකම තේරුම් ගෙන ගරු කථානායකතුමා ඒ සඳහා අපට අවසර දුන්නා. අදට නියමිත ශෝක ප්‍රකාශ යෝජනාව - ගරු සභානායකතුමාත්, ගරු විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාත් එකඟ වෙයි කියලා මම හිතනවා - තවත් දිනයකට යොමු කරලා සභාවේ එකඟතාව පරිදි අද දිනයේ සභාව කල් තබනවා නම් හොඳයි කියා මා හිතනවා. *[බාධා කිරීමක්]* They are agreeable, Sir.

**ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella)

එකඟයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ජාතික සභාව ස්ථාපිත කිරීම පිළිබඳ නිවේදනය අපට ලැබුණු වහාම ඊට අදාළ යෝජනා සම්මතය අනුමත කරන්න අපි කටයුතු කරනවා.

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී, අභාවප්‍රාප්ත ගරු අමරකීර්ති අතුකෝරළ මන්ත්‍රීතුමා පිළිබඳ කල් තබන ලද ශෝක ප්‍රකාශ යෝජනාව අද දිනටත් ගැනීමට නියමිතව තිබෙනවා. පසුගිය දිනයක එම ශෝක ප්‍රකාශ යෝජනාව පාර්ලිමේන්තුවට ගෙන ආවා. මා යෝජනා කරනවා, කල් තබන ලද එම ශෝක ප්‍රකාශ යෝජනාව ඉදිරි පාර්ලිමේන්තු රැස්වීම් දිනයක ගැනීමට නියම කරගෙන, සභාව කල් තැබිය යුතුයි කියලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

සභාව එකඟද?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

Aye.

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha)

ගරු කථානායකතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව පූ.භා. 9.53ට, 2022 සැප්තැම්බර් 20වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி மு.ப. 9.53 மணிக்கு பாராளுமன்றம், 2022 செப்ரெம்பர் 20, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 9.53 a.m. until 9.30 a.m. on Tuesday, 20th September, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.